**සෞන්දර්ය අධ්‍යයනය පිළිබඳ ස්වාමි විපුලානන්ද ආයතනය - 2014**

සෞන්දර්ය අධ්‍යයනය පිළිබඳ ස්වාමි විපුලානන්ද ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 107(5) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්ව විද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ.තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට සෞන්දර්ය අධ්‍යයනය පිළිබඳ ස්වාමී විපුලානන්ද ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**2.2.1 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වැඩ තහනම් කළ හෝ සේවයෙන් පහ කළ නිලධාරින් 04 දෙනෙකුගෙන් ලැබිය යුතු එකතුව රු.573,338 ක් වූ සේවක ණය ශේෂ වර්ෂ 03 කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි. කෙසේ වුවද එම හිඟ ශේෂයන් විගණන දිනය වූ 2015 ජුනි 30, දක්වාම අයකර ගෙන නොතිබුණි.

(ආ) නිලධාරින් 04 දෙනෙකුට ගෙවන ලද එකතුව රු.14,393 ක් වූ වැටුප් අත්තිකාරම් අදාළ නිලධාරින්ගෙන් අයකර ගැනීමට කටයුතු කිරීමෙන් තොරව වර්ෂ 03 කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි.

(ඇ) රු.1,652,862 ක මුදලක් නිරවුල් කිරීමට හෝ ගිණුම් පොත් වලින් කපා හැරීමට ඵලදායී පියවර ගැනීමෙන් තොරව ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලයට ගෙවිය යුතු මුදලක් ලෙස වර්ෂ 10 කට වැඩි කාලයක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

**2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) 2012 හා 2013 වර්ෂ සඳහා විගණිත මූල්‍ය ප්‍රකාශන හා ඒ සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තා 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 109 වගන්තිය ප්‍රකාරව 2015 අප්‍රේල් 24 දක්වා රජයේ ගැසට් පත්‍රයේ පළ කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 371(2) ප්‍රකාරව කාර්ය මණ්ඩලයට දෙනු ලැබූ අත්තිකාරම් එය දෙන ලද කාර්යය නිම කළ වහාම නිරවුල් කළ යුතුය. කෙසේ වුවද අවස්ථා 6 කදී දෙනු ලැබූ එකතුව රු.383,420 ක් වූ අත්තිකාරම් මාස 04 සිට මාස 07 දක්වා කාලයක ප්‍රමාදයකින් පසු නිරවුල් කර තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ කටයුතුවල ප්‍රතිඵලය පුනරාවර්තන වියදම සඳහා වූ රු.74,000,000 ක රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.90,919,352 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම සඳහා වූ රු.68,364,000 ක රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර එම වර්ෂයේ ඌනතාවය රු.70,750,664 ක් වූයෙන් මූල්‍ය

ප්‍රතිඵලයේ රු.20,168,688 ක තවදුරටත් පිරිහීමක් දැක්වුණි. පෙර වර්ෂයට සාපේක්ෂව රු.13,256,976 කින් පුද්ගලික පඩිනඩි වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ අධ්‍යයන කාර්ය සාධනය පහත පරිදි වේ.

(අ) විභාග ප්‍රතිඵල

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ පවත්වන ලද අවසන් විභාග විස්තර හා විභාග වලින් සමත්වූ ශිෂ්‍යයින් සංඛ්‍යාව පහත දැක්වේ.

| විස්තරය | සංගීත පීඨය | | නර්තන පීඨය | | නාට්‍ය හා රැගුම් පීඨය | | දෘශ්‍ය හා තාක්ෂණික කලා පීඨය | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2014 | 2013 | 2014 | 2013 | 2014 | 2013 | 2014 | 2013 |
| සමාලෝචිත වර්ෂය තුළ අවසාන විභාග සඳහා පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 38 | 26 | 29 | 25 | 39 | 50 | 46 | 43 |
| විභාගවලින් සමත්වූ ශිෂ්‍ය සංඛ්‍යාව | 23 | 19 | 27 | 22 | 38 | 46 | 32 | 33 |
| විභාග වලට පෙනී සිටි මුළු ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස විභාගවලින් සමත්වූ ශිෂ්‍ය සංඛ්‍යාව | 61 | 73 | 93 | 88 | 97 | 92 | 70 | 77 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කරනු ලැබේ.

සංගීත පීඨයේ සහ දෘශ්‍ය හා තාක්ෂණික කලා පීඨයේ අවසන් විභාග වලට පෙනී සිටි පිළිවෙලින් සිසුන් 38 දෙනෙකුගෙන් හා සිසුන් 46 දෙනෙකුගෙන් සිසුන් 15 දෙනෙකු හා 14 දෙනෙකු විභාග අසමත්වී තිබූ අතර එය අවසන් විභාග වලට පෙනී සිටි මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 39 ක් හා සියයට 30 ක් නියෝජනය විය.

### 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

මේ සම්බන්ධයෙන් පහත සඳහන් අකාර්යක්ෂමතා නිරීක්ෂණය විය.

(අ) රු.2,119,360 ක මුළු පිරිවැයකට 2013 වර්ෂයේදී තට්ටු ඇඳන් (Bank Beds) 45 ක් ආයතනය විසින් මිලදී ගෙන තිබුණි. කෙසේ වුවද මෙම ඇඳන් කුලී පදනම මත ලබාගෙන තිබූ ගොඩනැගිල්ලෙහි 2015 ජූලි 31 දක්වා නිෂ්කාර්යව පැවතුණි.

(ආ) මුළු පිරිවැය රු.190,000 කට මිලදී ගත් පරිගණක දෙකක් අරමුණු කළ කාර්යයන් සඳහා යොදා ගැනීමෙන් තොරව ඒවා මිලදී ගත් 2014 සැප්තැම්බර් 18, දින සිට ගබඩාවේ තබා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 7 කදී ආයතනයේ නිලධාරීන් තිදෙනෙකුට ගෙවන ලද එකතුව රු.300,080 ක් වූ අත්තිකාරම් අදාළ නිලධාරීන් විසින් 2015 ජුලි 31 දක්වාත් නිරවුල් කර නොතිබුණි.

(ඇ) නර්තන පීඨයේ ගබඩාවේ සිදුකරන ලද භෞතික තොග සමීක්ෂණයේදී රු.920,621 ක් වටිනා ගබඩා විෂයයන් 38 ක තොග ඌනතාවයක් අනාවරණය විය. කෙසේ වුවද එම විෂයයන් නැතිවීම පිළිබඳව වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විධිමත් පියවරක් ආයතනය විසින් ගෙන නොතිබුණි.

**4.3 මානව සම්පත් කළමනාකරණය**

2014 දෙසැම්බර් 31 දිනට අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| අධ්‍යයන | 38 | 36 | 02 | - |
| අධ්‍යයන සහාය | 07 | 01 | 06 | - |
| විධායක | 05 | 03 | 02 | - |
| ලිපිකරු හා සමාන්තර | 16 | 10 | 06 | - |
| කනිෂ්ඨ | 07 | 27 | - | 20 |
| එකතුව | 73 | 77 | 16 | 20 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී තනතුර හා ගබඩා භාරකරු තනතුර 2012 ජුලි 02 සිට පුරප්පාඩු වී පැවතුණි. මේ අතර එම තනතුරු සඳහා සුදුසු නිලධාරීන් පත් කිරීමට කටයුතු කිරීමෙන් තොරව නැගෙනහිර විශ්ව විද්‍යාලයේ නිලධාරීන් එම තනතුරු දෙක සඳහා වැඩ බැලීමේ පදනම මත රාජකාරී සිදුකර තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ වැඩ බැලීමේ දීමනා ලෙස රු.101,719 ක මුදලක් ගෙවා තිබුණි.

(ආ) කනිෂ්ඨ සේවකයින් සඳහා අනුමත සේවක සංඛ්‍යාව 07 ක් වූ නමුත් ආයතනය විසින් සේවකයන් 20 දෙනෙකු අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා බඳවා ගෙන තිබුණි. තවද මෙම අතිරික්ත සේවක සංඛ්‍යාව සඳහා අදාළ අධිකාරීන්ගෙන් අවශ්‍ය අනුමැතිය ආයතනය විසින් ලබාගෙන නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**5.1 අයවැය පාලනය**

අයවැයගත සහ තථ්‍ය ආදායම හා වියදම අතර සියයට 20 සිට සියයට 2,524 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**6. පද්ධති හා පාලන**

**--------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) වත්කම් කළමනාකරණය
(ආ) ප්‍රසම්පාදනය
(ඇ) අත්තිකාරම් ගෙවීම